**බඳවා ගැනීමේ විභාග**
**අයදුම්පත් මාර්ගගතව සම්පූර්ණ කිරීම සඳහා පොදු උපදෙස්**

**අංක 2317 දරණ 2023.01.27 දිනැති ගැසට් පත්‍රයේ " දිවයිනේ ජාතික පාසල් හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2023" මැයෙන් පළ කරන ලද ගැසට් නිවේදනයට අනුව ඔබ 2023.02.10 දිනට ප්‍රථම මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්කර ඇති අයෙකු නම් , ඔබ විසින් එම අවස්ථාවේ යොමු කරන ලද අයදුම්පත මෙම ගැසට් නිවේදනය ප්‍රකාරව යොමු කරන ලද අයදුම්පතක් ලෙස සලකා කටයුතු කරන බැවින් නැවත අයදුම්කිරීම අවශ්‍ය නොවේ.**

**අයදුම්පතේ මෘදු පිටපත https://applications.doenets.lk වෙබ් අඩවියේ මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති පහත එක ආකාරයකින් බාගත කරගත හැක.**

- **E***** ලෙස කෙටි පණිවුඩයක් මඟින් ලැබෙන යොමු අංකය (Reference No.) ඔබ සතුව පවතී නම්, " Continue After Payment" මෙනුව තුළින් අයදුම්පත ලබා ගත හැකි වේ.**
- **යොමු අංකය නොමැති නම් Edit and Submit මෙනුව ඔස්සේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත්කර අයදුම්පත ලබා ගත හැකි වේ.**

<u>**(අ) පොදු උපදෙස්:**</u>

1. මාර්ගගත (Online) අයදුම්පත <u>**ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක්**</u> සම්පූර්ණ කළ යුතු අතර, මෙම උපදෙස් පත්‍රිකාව අවසානයේ ඇති <u>**ඇමුණුමේ ආකෘතිය**</u> අනුව සම්පූර්ණ කළ යුතුය.
2. අයදුම්කරු විසින් මාර්ගගත අයදුම්පතේ ඇතුළත් කරනු ලබන ජංගම දුරකථන අංකය වෙත විභාගය සම්බන්ධව සිදුකරනු ලබන සියලුම දැනුම්දීම් SMS මඟින් එවනු ලබන බැවින්, අයදුම්කරු වෙත එම තොරතුරු ලබා ගත හැකි ජංගම දුරකථන අංකයක් යෙදිය යුතු වේ.
3. **එක් අයදුම්කරුවකු හට ඉදිරිපත් කළ හැකි වන්නේ එක් අයදුම්පතක් පමණි.** මාර්ගගත පද්ධතියට ප්‍රවේශවීම (Login) සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කරන්න. අන් අයගේ ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කිරීමෙන් වළකින්න.
4. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) වන “ ” ?: { }[ ]’!`~#$%^* <> = + - _ | නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අර්ධ වශයෙන් යොමු වීම හෝ ප්‍රතික්ෂේප වීම මත සිදුවන අපහසුතා අයදුම්කරු විසින් දරාගත යුතු වේ.

5. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

   i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

   ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මඟින් (Bank Debit Card with internet payment facility)

   iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මඟින් (Online Banking method of Bank of Ceylon)

   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Bank of Ceylon branch)

(ලංකා බැංකු ශාඛාවක් මඟින් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් ගෙවීම සිදු කිරීමට අදාළව ඔබට අනන්‍යව E***** ලෙස ලැබෙන යොමු අංකය (Reference No.) අනිවාර්යයෙන් යෙදිය යුතුය.)

6. ඉහත ක්‍රම මඟින් ගෙවීම් කරනු ලබන ආකාරය සඳහා (ආ) **තාක්ෂණික උපදෙස්** බලන්න. **අයදුම්කරුවන් හට මුදල් ගෙවීමේ ක්‍රමවේද (Payment Method) වෙනස් කළ හැක්කේ එක් වරක් පමණි.**

7. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලබන අතර, විභාග ගාස්තු ආපසු ගෙවීම (Refund) හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

8. **සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේ දැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. (පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් පරිදි)** අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලද නීති රීතිවලට එකඟ වන බව තහවුරු කළ යුතුය.

9. **ඉන් පසු "Submit this application" හා "Proceed to payment" click කර, මුදල් ගෙවා "Complete and Submit" click කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතුය.**

10. අදාළ විභාගයට මුදල් ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු, එය බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගෙන අත්සන සහතික කිරීමෙන් අනතුරුව, **පසුව කරනු ලබන විමසීම් සඳහා එහි පිටපතක් ළඟ තබාගත යුතුය.**

11. මාර්ගගත අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.

   a. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   b. මුදල් නොගෙවන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   c. දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

12. අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල මඟින් එවනු ලබන අවස්ථාවලදී (උදා: විශේෂ අවස්ථා සහිත අයදුම්කරුවන්) නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.

13. විමසීම් කිරීම - කාර්යාලීය වේලාවන් **තුළදී පමණි.**

- විභාගයට අදාළ කරුණු පිළිබඳව - ගැසට් පත්‍රයේ/ විභාග නිවේදනයේ සඳහන් වන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව මඟින්
- විභාග අයදුම්පත් යොමු කිරීමේදී ඇති වන සාමාන්‍ය ගැටලු පිළිබඳව (ආයතනික විභාග සංවිධාන ශාඛාව) - 011-3661244
- විභාග අයදුම්පත් යොමු කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටලු පිළිබඳව (පරිගණක ශාඛාව) - 011-2784226
- ලංකා බැංකු ශාඛා මඟින් ගෙවීම් පිළිබඳව - 1975

14. අයදුම්පත් මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.

15. අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.

16. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෘදු පිටපතේ (Soft copy) සඳහන් තොරතුරු නිවැරදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.


**<u>(ආ) තාක්ෂණික උපදෙස්:</u>**

1. **පද්ධතියට ප්‍රවේශ වීම**

   i. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න (www.doenets.lk).


   ii. එහි අපගේ සේවා (Our Services) යටතේ ඇති “**Online Applications (Recruitment/ EB** Exams)**”** මුහුණත (Tile) මත Click කරන්න.

   iii. ඉන්පසු ඔබට පහත දිස්වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




iv. එහි ඇති “**Apply for Exams**” මගින් අදාළ විභාගය වෙත ප්‍රවේශ විය හැක.

## 2. “Apply for Exams”





i. අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස්වේ.


ii. යම් අවස්ථාවන්හිදී එකම ආයතනයක් විසින් අයදුම්පත් කැඳවනු ලබන විභාග කිහිපයක් තිබිය හැකි බැවින්, අයදුම්පත් යොමු කිරීමට බලාපොරොත්තුවන විභාගය අවධානයෙන් යුතුව තෝරා ගත යුතු වේ. අයදුම් කිරීමෙන් පසුව විභාග මාරු කිරීම සිදුකළ නොහැක.

iii. එහිදී විභාගය සම්බන්ධ ගැසට්/ විභාග නිවේදනය හා උපදෙස් පත්‍රිකාව බාගත කළ හැක.

- **Apply** - පළමුව ඔබට ප්‍රවේශ වීමේ කවුළුවක් (Login Window) දර්ශනය වන අතර **එහි ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.** එයට අමතරව තම ජංගම දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හෝ ඒ දෙකම හෝ ඇතුළත් කර "**I Agree with the Terms and Conditions**" "√" කර **reCAPTCHA** "√" කර "**Next**" Click කරන්න.




- ඔබට පහත කවුළුව (Verify OTP Window) දිස්වේ. ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊ-මේල් ලිපිනයට ලැබී ඇති **OTP verification code** ඇතුළත් කර "**Submit**" click කරන්න.




3. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු

අයදුම්කරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට වම්පස පහත රූපයේ දිස්වන පරිදි button දෙකක් දක්නට ලැබේ.




- "**Save**" - මෙය click කිරීමෙන් ඔබට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව තෙක් ඔබගේ තොරතුරු පිරවිය හැකි වේ.
- අයදුම්පතේ සියලු තොරතුරු ඇතුළත් කළ පසු ඉදිරියට යාමට "Submit this application" click කළ යුතුය.
- ඔබ විසින් "**Submit this application**" click කිරීම සහ ඉන්පසු සිදුකළ යුතු ඉදිරි ක්‍රියාවලිය සිදු නොකරන්නේ නම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසුව ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

- "**Submit this application**" click කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු පහත රූපයේ පරිදි දිස්වේ (preview).

Personal Information

| | |
|---|---|
| Select the relevant title | -- |
| Name in Full (IN BLOCK CAPITAL LETTERS) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Postal Address (IN BLOCK CAPITAL LETTERS) | 254/2, PELAWATTA, BATTARAMULLA. |
| Contact Number (Mobile)(For the future communication through SMS) | 0712874125 |
| Contact Number (Residence) | 0112478452 |
| Email Address | test@gmail.com |
| Gender | Male |
| Date of Birth | 02 Jun 1992 |
| Are you a citizen of Sri Lanka? | Yes |

Educational Qualifications (English Language)

| | |
|---|---|
| Do you possess a Credit pass in English Language at the G.C.E. (O/L) or N.C.G.E. or S.S.C. or international GCSE Examination? | Yes |
| Grade obtained | C |
| Name of the examination | G.C.E.(O/L) Examination |
| Name of the Dept./ Institution | Department of Examinations |
| Year | 2003 |

- යම් හෙයකින් ඔබගේ තොරතුරු නැවත සංශෝධනය (Edit) කළ යුතු නම්, Edit and Submit මඟින් නැවත අයදුම්පත වෙත ගොස් ( ←——— ) , සංශෝධනය (Edit) කර, “Submit this application” click කිරීමෙන් ඉදිරියට යා හැකිය.

- ඇතුළත් කරන ලද තොරතුරු නිවැරදි නම් පහත රූපයේ පරිදි එකඟතාව පළකිරීමෙන් ඉදිරියට යා හැකිය.




“Proceed” click කිරීමෙන් පසු පහත පරිදි දිස් වේ.





“Proceed to payments “ click කිරීමෙන් මාර්ගගතව විභාග අයදුම්පත සඳහා මුදල් ගෙවීමේ පිටුවට යොමු වේ.

## 2. විභාග ගාස්තු ගෙවීම


**සැ.යු. අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය (Payment Method) වෙනස් කිරීමට හැකියාව ලබාදී ඇත්තේ එක්වරක් පමණි.**

පහත රූපයේ පෙන්වා ඇති පරිදි ඔබ විසින් විභාග ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය තෝරන්න.




➢ **Pay with Credit/ Debit Card** ක්‍රමවේදය

- මේ සඳහා සේවා ගාස්තු වශයෙන් විභාග ගාස්තුවෙන් 1.7% ක මුදලක් අයකරනු ලබයි.
- ඉහත ක්‍රමවේදයෙන් ගෙවීම් කිරීම සඳහා ඔබගේ **Credit/ Debit** කාඩ්පත අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු **Credit/ Debit** කාඩ්පතක් විය යුතුය.
- එසේ නොවන බැංකු **Credit/ Debit** කාඩ්පත් මඟින් ගෙවීම් කළ නොහැකිවන අතර ඔබගේ ගෙවීම ප්‍රතික්ෂේප වේ.





➢ **Pay with BOC** ක්‍රමවේදය

“**Pay with BOC**” මඟින් මුදල් ගෙවීමේදී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන **ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගොස් හෝ ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමවේදයෙන් (B App මඟින් හෝ Flex App)** හෝ මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය.


**විභාග දෙපාර්තමේන්තු ගිණුම් අංකයට සෘජුවම Slip මඟින් ගෙවීම් නොකළ යුතුය.**

නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති "**Online Applications (Recruitment Exams)**" මුහුණත (Tile) මත Click කර හෝ https://applications.doenets.lk වෙත පිවිස එහි "**Continue after payment**" Click කරන්න. ඉන්පසු ඔබේ යොමු අංකය (Reference Number) ඇතුළත් කර ඉදිරියට යන්න.


සැ.යු: "**Pay with BOC" මගින් ගෙවීම් කිරීමේදී ලංකා බැංකුව විසින් සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු. 20.00 ක මුදලක් අයකරනු ලබයි.**





- ➢ මුදල් ගෙවූ පසු නැවත මාර්ගගත පද්ධතියට පිවිස එහි ඇති "**Continue after Payment**" click කරන්න.




- ➢ ඉන්පසු පහත රූපයේ පරිදි ඔබගේ යොමු අංකය (**Reference Number**) පද්ධතියට ඇතුළත් කර ඉදිරියට යන්න.





- ඉහත ක්‍රම මඟින් මුදල් ගෙවූ පසු, මුදල් ගෙවූ බවට අදාළ ලදුපත ප්‍රදර්ශනය වන අතර, එය මුද්‍රණය කර ගත හැක. එසේම මෙම තොරතුර ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊමේල් ලිපිනයට ද යැවේ.




## 3. අයදුම්පත මාර්ගගතව යොමු කිරීම

මුදල් ගෙවූ පසු අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා පහත රූපයේ පරිදි විභාග දෙපාර්තමේන්තු කොන්දේසිවලට (**Terms and Conditions**) එකඟ වන බවට හා අයදුම්පත යොමු කිරීම තහවුරු කිරීම (**Confirm**) සිදුකළ යුතුය. ඉන්පසු “**Complete & Submit**” click කරන්න.




## 4. අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Printout) ලබා ගැනීම

පහත රූපයේ පරිදි “**Download my application**” click කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කළ හැක. බාගත කළ පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිදු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතුය.




## 5. මාර්ගගත අයදුම්පත ලද බව දැන්වීම

අයදුම්පත් භාර ගැනීම අවසන් වූ පසු අයදුම්පත දෙපාර්තමේන්තු පද්ධතිය මඟින් තහවුරු කළ පසු අයදුම්පත ලද බව SMS මඟින් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.

**දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2023 (2026)**

**<u>මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා විශේෂ උපදෙස්</u>**

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේදී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

i. සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

විභාගයට පෙනී සිටින මාධ්‍යය, විභාගය සඳහා පෙනී සිටින නගරයන් හා අයදුම්කරන පාසල් වර්ගය තෝරන්න.

## Medium / Town / School Type

* Medium of Language:

(●) Sinhala ( ) Tamil ( ) English

* Exam Town First Preference

Colombo

* Exam Town Second Preference

Gampaha

* School Type applied for: (Please use schedule 2)

Both National and Provincial Schools

Select the preferred type from the list

ii. අයදුම්කරු අයදුම්කරනු ලබන අ.පො.ස.(සා.පෙළ) විෂයන් සහ අ.පො.ස.(උ.පෙළ) විෂයන් සඳහන් කරන්න.

Subjects under G.C.E. (Advanced Level) and 13-Year Guaranteed Education Program

* (a) Subject 01

Chemistry

* (a) Subject 02

Physics

Subjects under G.C.E. (Ordinary Level) and other subjects

* (b) Subject 01

Science

* (b) Subject 02

Mathematics

iii. පෞද්ගලික තොරතුරු පිළිබඳ සඳහන් කරන්න.

## Personal Information

* Full Name : (In English Block Letters) Eg-AMRAKOON MUDIYANSELAGE NAMAL HERATH

GUNAWARDHANA MAHESH GAYASHAN BANDARA SAMAN KUMARA

Max Length : 90

* Name with initials: (Name with last name first and the initials of the other names at the end (In English Block Letters) Eg. : HERATH A.M.N)

GUNAWARDHANA, M.G.B.S.K

Max Length : 90

* Permanent Address (IN BLOCK CAPITAL LETTERS)

254/2,PELAWATTA, BATTARAMULLA

Must use Commas (,) and type IN BLOCK CAPITAL LETTERS as shown in the example : 154/1, PELAWATTA, BATTARAMULLA. Max Length : 150

* Province/District related to permanent residence

Western Province/Colombo

* Do you agree to work in another province if there are no vacancies for the relevant subject in the national school or provincial school applied for ?

Yes - Central Province

* Gender

Female

* Mobile Telephone Number

1111111111

Fixed Telephone Number.

1111111111

Email Address

test@gmail.com

* Marital Status

Single

* Date of Birth

2/10/1978

* Age as at 10.02.2023

31 Years 02 Months 21 Days

Eg. : 31 Years 02 Months 21 Days Max Length : 35

iv. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.

## Particulars about Educational Qualifications

G.C.E. (Ordinary Level) Examination

Year:

1990

Max Length : 4

* Index No:

1111111111

Max Length : 20

* Results

| | Subject | Grade |
|---|---|---|
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |

⊕

G.C.E. (Advanced Level) Examination

* Year :

1994

Max Length : 4

* Index No. :

2222222222

Max Length : 20

* Results

| | Subject | Grade |
|---|---|---|
| ⊖ | TEST | A |
| ⊖ | TEST | A |
| ⊖ | TEST | B |

⊕

v. උසස් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.

## Particulars about Higher Educational Qualifications

* Degree obtained : -

TEST

* University awarded :-

TEST

* Effective Date of the Degree :-

2000-10-06

* Main subject/subjects followed for the Degree

| | Subject / Subjects |
|---|---|
| ⊖ | PHYSICS |
| ⊖ | MATHEMATICS |

⊕

* Medium of language in which the degree has been obtained :-

English

vi. අයදුම්කරුගේ ප්‍රකාශය

### (6). Applicant's Statement

I do hereby declare that the information furnished here are true according to my knowledge and belief. I am aware that I will be dismissed from the service if it is revealed that I am not eligible to be appointed to this Post after being selected to the Post. Any information mentioned herein will not be altered later. Also, I declare that I have paid the due examination fee. Further, I declare that I will be subject to rules and regulations imposed by the Commissioner General of Examinations pertaining to the conduct of the Examination and the issuance of results.

Date :- ____________________ Signature of Candidate :- ______________________

vii. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

**(7). Attestation of Signature of the Applicant**

I certify that Mr./Mrs./Miss. ________________________________ submitting this application is personally known to me and he/she placed his/her signature before me on________________ and he/she has paid the due Examination fee.

Date :- __________ Signature of the officer attesting the signature :- ________________

Full Name of the attester:-

Designation:-

Address:-

(Please substantiate with the official stamp)

viii. ආයතන ප්‍රධානියාගේ සහතිකය

**(8). Certification of the Head of the Institute / Department**

The application of Mr. /Mrs. /Ms.________________________________ is submitted. It is notified that Mr. /Mrs. /Ms.____________________________________ is serving in this Ministry/ Department as a permanent employee and that he/she can be released from the service if he/ she is selected for this post.

______________________________

Signature of the Head of the Department or the officer Authorized

Date:-

Designation:-

Ministry / Department:-

(Substantiate with the Official Stamp)

- දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- මුද්‍රිත පිටපත ලබාගත් පසු මුදල් ගෙවීම සම්බන්ධයෙන් පහත පරිදි දිස් වේ.

| *Official use only* | |
|---|---|
| **Payment Information** | |
| NIC | 444444444444 |
| Application Reference | EMHBEH |
| Payment Date and Time | 01-01-1970 05:30:00 |
| Exam Applied | COMPETITIVE EXAMINATION FOR THE RECRUITMENT OF GRADUATES IN THE PUBLIC SERVICE TO THE SRI LANKA TEACHERS' SERVICE FOR SINHALA, TAMIL AND ENGLISH MEDIUM TEACHER VACANCIES IN NATIONAL AND PROVINCIAL SCHOOLS OF THE ISLAND - 2023 (2026) |
| Exam Fee | 2,700.00 LKR |
| Total fee Paid | 0.00 LKR |

❖ **මෙම විභාගය සම්බන්ධයෙන් යම් විමසීමක් වේ නම්, පහත සඳහන් දුරකථන අංක ඔස්සේ අධ්‍යාපන අමාත්‍යාංශය අමතන්න.**

**සිංහල මාධ්‍ය - 0112784819 / 0112785634**

**දෙමළ මාධ්‍ය - 0112785634**

**ඉංග්‍රීසි මාධ්‍ය - 0112785258 / 0112784819 / 0112787399**

**HOT LINE - 1988**